SRI LANKA EXPORT DEVELOPMENT BOARD

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# SEAFOOD EXPO GLOBAL

## BARCELONA, SPAIN

## 20th -22nd APRIL 2027

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2027 අප්‍රේල් 20 සිට 22 දක්වා ස්පාඤ්ඤයේ බාසිලෝනා හි පැවැත්වීමට නියමිත SEG 2027 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමට කටයුතු සුදානම් කර ඇත.

SEG යනු රටවල් 156 කින් මුහුදු ආහාර ක්ෂේත්‍රයේ වෘත්තිකයන් 35,300 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කරන ලොව විශාලතම මුහුදු ආහාර ප්‍රදර්ශනයයි. බහු-ඒකක සිල්ලර හා ආහාර සේවා ආයතනවල විශාල පරිමාණ මුහුදු ආහාර මිලදී ගන්නන් ඇතුළු ප්‍රධාන මිලදී ගන්නන් සිය ගණනක් ආකර්ෂණය කර ගනිමින්, එය ගෝලීය මුහුදු ආහාර වෙළඳපොළ ලෙස ක්‍රියා කරයි.

**කා සඳහාද**

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකරන සහ ගෝලීය වෙළඳපොළ සපයාලීමේ හැකියාව ඇති මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනකරුවන්, සකස්කරන්නන් සහ විභව අපනයනකරුවන්ගෙන් මේ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සහාය**

ප්‍රදර්ශන කුටිය සඳහා වන ඉඩකඩ වෙන්කර ගැනීමේ සහ කුටිය ඉදිකිරීමේ පිරිවැය ඇතුළු අනෙකුත් සියලුම අදාළ වියදම් සහභාගී වන සමාගම් විසින් දරාගත යුතුය. කෙසේ වෙතත්, පවතින ප්‍රතිපාදන පදනම්ව, තෝරාගත් සමාගම් සඳහා ප්‍රදර්ශන කුටියේ ඉඩකඩ සහ ඉදිකිරීම් පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය සහාය ලබා දීමට අපනයන සංවර්ධන මණ්ඩලය සලකා බලනු ඇත.

**අයදුම් කිරීම සහ තේරීම**

නියමිත අයදුම්පත්‍ර අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) අපනයන කෘෂිකර්ම අංශයෙන් (6 වන මහල) ලබා ගත හැකි අතර, www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements" කොටසින් ද බාගත කර ගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, කවරයේ ඉහළ වම්පස කෙළවරේ "Seafood Expo Global 2027" යනුවෙන් සඳහන් කර, 2026 සැප්තැම්බර් 14 වන දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ – අපනයන කෘෂිකර්ම, EDB වෙත ලැබීමට සැලැස්විය යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා EDB විසින් පත් කරන ලද මණ්ඩලයක් මගින් කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ඇත.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර යමුනා සුමනරත්න මෙනෙවිය / සහකාර අධ්‍යක්ෂිකා **011-2300732, 2300705-11** (දිගුව: 388) හෝ **yamuna@edb.gov.lk** විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ කරගන්න.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**EDB/NDB කුලුන, 42, නවම් මාවත, කොළඹ 02**

**වෙබ් අඩවිය : www.srilankabusiness.com**